# මාසික

# විවරණිකාව

2011 දෙසැම්බර්



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

61 වැනි වෙළුම 12 වැනි කලාපය

**2011 දෙසැම්බර්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විචරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විචරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විචරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

# පටුන

*පිටුව*

1 වන කොටස - මාසික සිදුවීම් ..... 05

2 වන කොටස - පුවත්පත් නිවේදන - 2011 දෙසැම්බර් ..... 06

1. උද්ධමනය 2011 නොවැම්බර් මාසයේ දී තවදුරටත් පහළ වැටෙයි ..... 06
2. අධ්‍යක්ෂවරුන්ගේ සමුළුව - 2011 බැංකු නොවන මූල්‍ය ආංයතන අංශය " තිරසාර හා සංයුක්ත වර්ධනයක් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන ප්‍රතිස්ථාපනය කිරීම" ..... 07
3. රජයේ සුරැකුම්පත්හි විදේශීය ආයෝජන සඳහා වන සීමාව වැඩි කිරීම ..... 07
4. 2011 සැප්තැම්බර් මාසයේ විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය ..... 08
5. දේශීය සමාගම්වල ස්ථාපිත ණයකරයන්හි කරනු ලබන විදේශීය ආයෝජනයන් සහ විදේශීය ණය ගැනීම් සම්බන්ධයෙන්වන රෙගුලාසි ලිහිල් කිරීම ..... 11
6. කෘෂි බෝග හා දියර කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය ණය යෝජනා ක්‍රමය යටතේ සත්ව සංවර්ධන උපදේශකවරුන්ගේ සේවාව ඇගයීම - 2010 ..... 12
7. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 දෙසැම්බර් ..... 13
8. 2011 ඔක්තෝබර් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය ..... 15
9. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2010 සහ 2011 ..... 18

# 1 වන කොටස
# මාසික සිදුවීම්
## 2011 දෙසැම්බර්

**රාජ්‍ය මූල්‍ය අංශය**

අර්තාපල් ආනයනයේ දී විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස 4 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 35 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා අඩු කරන ලදී.

**ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙන් ලද ණය**

හදිසි ආපදා කළමනාකරණ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 සැප්තැම්බර් 29 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අතර ජපන් යෙන් මිලියන 7000 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 10.08 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා සියයට 0.01 වාර්ෂික පොලී අනුපාතිකයක් ද සියයට 0.1 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 40 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**බෙල්ජියමේ ෆෝටිස් බැංකුවෙන් (Fortis Bank) ලද ණය**

කොලොන්න - බලංගොඩ ජල සැපයුම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ෆෝටිස් බැංකුව අතර යූරෝ මිලියන 10.48 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 6.61 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා සියයට 0.8 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ද, ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.25 ක අනිවාර්ය ගෙවීමක් ද, ණය මුදල මත සියයට 0.5 ක මූලික ගෙවීමක් ද අදාළ වේ. මාස 6 ක සහන කාලයකට යටත්ව වසර 9 සහ මාස 6 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**ලෝක බැංකුවෙන් ලද ප්‍රදාන**

සෞඛ්‍ය අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 දෙසැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව අතර එ.ජ.ඩොලර් 400,000 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 45.56 ක ) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ණය**

ජාතික මහා මාර්ග පද්ධති ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 දෙසැම්බර් 14 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර එ.ජ.ඩොලර් මිලියන 85 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 9.68 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය මත සියයට 0.6 ක වාර්ෂික පොලී අනුපාතිකයක් අදාළ වන අතර ඉන් සියයට 0.3 ක් ආපසු ගෙවනු ලැබේ. මීට අමතරව ණය මුදලෙහි ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.15 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 25 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**මහජන බැංකුවෙන් ලද ණය**

කොලොන්න - බලංගොඩ ජල සැපයුම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 දෙසැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා රජය සහ මහජන බැංකුව අතර යූරෝ මිලියන 10.86 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.62 ක) ණය මුදල සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා මාස 6 ක් සඳහා වන යූරෝ අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය මත සියයට 3.5 ක වාර්ෂික පොලී අනුපාතිකයක් අදාළ වේ. වසර 2 ක සහන කාලයකට යටත්ව වසර 14 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**ප්‍රංශ සංවර්ධන ආයතනයෙන් ලද ණය**

යාපනය - කිලිනොච්චි ජල සැපයුම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 දෙසැම්බර් 31 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශ සංවර්ධන ආයතනය අතර, යූරෝ මිලියන 3 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 442.27 ක) ණය මුදල සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී. ණය මුදල සඳහා මාස 6 ක් සඳහා අදාළ වන යූරෝ අන්තර් බැංකු අර්පණ අනුපාතිකය මත සියයට 0.25 ක් ද, ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.25 ක අනිවාර්ය ගෙවීමක් ද, මූලික මුදලින් සියයට 0.25 ක ගෙවීමක් ද අදාළ වේ. වසර 7 ක සහන කාලයකට යටත්ව වසර 25 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**II වන කොටස**


# පුවත්පත් නිවේදන

**2011 දෙසැම්බර්**

## 1. උද්ධමනය 2011 නොවැම්බර් මාසයේ දී තවදුරටත් පහළ වැටෙයි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) (2006/07=100) මගින් මනිනු ලබන උද්ධමනය 2011 ඔක්තෝබර් මස පැවති සියයට 5.1 සිට නොවැම්බර් මාසයේ දී සියයට 4.7 දක්වා පහළ වැටිණි. මෙම අඩුවන ප්‍රවණතාවය නිරීක්ෂණය කරනු ලැබුවේ අනුක්‍රමික හතරවන මාසයටය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද, ඔක්තෝබර් මාසයේ පැවති සියයට 7.1 හි සිට නොවැම්ර් මාසයේ දී සියයට 6.9 දක්වා පහළ ගියේය. මීට අමතරව, 2011 නොවැම්බර් මස මූලික උද්ධමනය ද ඔක්තෝබර් මාසය හා සැසඳීමේ දී ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය යන දෙයාකාරයේම පදනම් මත පිළිවෙළින් සියයට 4.9 සහ සියයට 7.2 දක්වා නොකඩවා පහත වැටිණි.*

මේ අතර, මාසික දර්ශකයෙන් පෙන්නුම් කෙරෙන පරිදි පූර්ව මාසයට සාපේක්ෂව පොදු මිල මට්ටමෙහි සියයට 0.7 ක සුළු ඉහළ යාමක් 2011 නොවැම්බර් මාසයේ දී වාර්තා විය. දර්ශකය නිරපේක්ෂ වශයෙන් 2011 ඔක්තෝම්බර් මස පැවති 151.5 හි සිට නොවැම්බර් මාසයේ දී 152.6 දක්වා වැඩි විය. දර්ශකයේ මාසික ඉහළ යාම කෙරෙහි ආහාර නොවන කාණ්ඩයේ (සියයට 0.9) මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ (සියයට 0.5) මිල ගණන් ඉහළ යාම ද මෙයට හේතු විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි මිල හැසිරීම්වලට ප්‍රතිචාරයක් වශයෙන් ඉන්ධන මිල ඉහළ නංවමින් සිදු කළ සංශෝධනය සහ අයහපත් කාලගුණික තත්ත්වයන් හා ඍතුමය සාධක නිසා පහළ වැටුණු සැපයුම හේතුවෙන් විශේෂයෙන්, මාසයේ අග භාගයේ දී ඇතැම් එළවළු වර්ග, දෙහි, අමුමිරිස්, ලොකු ළූණු, රතු ළූණු හා සහල් මිලෙහි සිදුවූ ඉහළ යාම කො.පා.මි. දර්ශකයෙහි ඉහළ යාමට දායක විය. ආහාර නොවන කාණ්ඩය තුළ, ප්‍රවාහන (සියයට 2.1); රෙදිපිළි හා පාවහන් (සියයට 1.4); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 1.1); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.5); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.4); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.5), යන උප කාණ්ඩවල මිල ගණන් ඉහළ ගියේය. පෙර මාසය සමග සැසඳීමේ දී 2011 නොවැම්බර් මස දී පොල්, පොල් තෙල්, මත්ස්‍ය හා මුහුදු ආහාර, කුකුල් මස්, බිත්තර, සීනි සහ පරිප්පුවල මිල ගණන් පහළ යාමක් ද වාර්තා විය. මේ අතර, සෞඛ්‍යය; සන්නිවේදන; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.



## 2. අධ්‍යක්ෂවරුන්ගේ සමුළුව - 2011
## බැංකු නොවන මූල්‍ය ආයතන අංශය
## "තිරසාර හා සංයුක්ත වර්ධනයක් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන ප්‍රතිස්ථාපනය කිරීම"

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන (ලියාපදිංචි මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්) සඳහා සිව්වන වරට පවත්වනු ලබන අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික සමුළුව 2011 දෙසැම්බර් මස 02 වන දින කොළඹ ගලධාරී හෝටලයේ දී පවත්වනු ලැබේ. මේ සඳහා ලියාපදිංචි මුදල් සමාගම් 38 ක හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 17 ක සභාපතිවරුන්, අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන විධායක නිලධාරීන් 300 කට වැඩි ප්‍රමාණයක් සහභාගිවීමට නියමිතය.*

"තිරසාර හා සංයුක්ත වර්ධනයක් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන ප්‍රතිස්ථාපනය කිරීම" යන්න මෙම වර්ෂයේ පවත්වනු ලබන සමුළුවේ තේමාව වේ. මූල්‍ය පහසුකම් සඳහා සපයනු ලබන දායකත්වය තවදුරටත් පුළුල් කරමින් ශීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථික කටයුතු උදෙසා සුවිශේෂී වූ දායකත්වයක් බැංකු නොවන මූල්‍ය අංශයෙන් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූල්‍ය ස්ථායීතාවය තහවුරු කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය අංශයේ තිරසාර වර්ධනය අත්‍යවශ්‍ය වේ. ව්‍යාපාර ආකෘතීන් ප්‍රතිසංවිධානය කිරීම, සාංගමික යහපාලනය හා සඵලදායී අවදානම් කළමනාකරණය මෙවර සමුළුවේ දී ආවරණය වන මාතෘකාවන් වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා සමුළුවේ ප්‍රධාන දේශනය පවත්වනු ලබයි.

## 3. රජයේ සුරැකුම්පත්හි විදේශීය ආයෝජන සඳහා වන සීමාව වැඩි කිරීම

*මෙම වසර තුළ මේ දක්වා, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදෙන ලද ණයෙහි දක්නට ලද ඉහළ, වර්ධනය තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, ශ්‍රී ලංකා ආර්ථිකය සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කරමින් සිටී. මේ අතර, මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය අඩු මට්ටමක පවතී. කෙසේ වුවද, මෑත සතිවල දී දේශීය මුදල් වෙළෙඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතා මට්ටම අඩුවීම කෙටිකාලීන වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්හි ඉහළ යාමට හේතු විය. මේ අතර, දියුණු ආර්ථිකයන්හි වර්ධනය වෙමින් පවතින අවිනිශ්චිතතාවයන් මෙන්ම නැගී එන ආර්ථිකයන් පිළිබඳව පවත්නා ඉහළ අපේක්ෂාවන්හි ප්‍රතිඵලයක් ලෙස, විදේශ ආයෝජකයන් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ ආයෝජනය කිරීමට ඇති කැමැත්ත අඛණ්ඩව ප්‍රකාශ කර ඇත.*

මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 දෙසැම්බර් මස 05 දින පැවති රැස්වීමේ දී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරයන්හි විදේශීය ආයෝජන සඳහා දැනට පවතින, සීමාව වන නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල නොපියවූ ශේෂයෙන් සියයට 10 ක සීමාව සියයට 12.5 දක්වා ඉහළ දැමීමට තීරණය කරන ලදී. මෙමගින් දේශීය වශයෙන් උපයෝජනය සඳහා ඇති සම්පත් ප්‍රමාණය වැඩි කරමින් ආර්ථිකයෙහි වර්ධන ප්‍රවණතාවට සහාය වන අතරම, දේශීය ඉතුරුම් - ආයෝජන පරතරය අඩු කරමින් පොලී අනුපාතික මත වන පීඩනයන් සීමා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විනිමය පාලක විසින්, බලයලත් අලෙවිකරුවන් සඳහා වන නව විධානයන් අදාළ පරිදි නිකුත් කරනු ඇත.

## 4. 2011 සැප්තැම්බර් මාසයේ විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය

*ආර්ථික ක්‍රියාකාරකම්හි වර්ධනයක් පිළිබිඹු කරමින්, 2011 සැප්තැම්බර් මාසයේ දී විදේශීය වෙළෙඳාම තවදුරටත් වර්ධනය විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට දී 2011 සැප්තැම්බර් මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 854 ක් දක්වා සියයට 20.4 ක වර්ධනයක් පිළිබිඹු කළ අතර, ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,759 ක් දක්වා සියයට 61.3 කින් වර්ධනය විය.*

කාර්මික අපනයන වර්ධනය සඳහා මූලික වශයෙන් දායක වූයේ රෙදිපිළි හා ඇඟළුම්, දියමන්ති හා ස්වර්ණාභරණ, රබර් නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයනයන්ය. 2011 සැප්තැම්බර් මාසයේ දී රෙදිපිළි හා ඇඟළුම් අපනයන සියයට 13.7 කින් වර්ධනය වූ අතර, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයනය සියයට 88.7 ක් ලෙසින් සැලකිය යුතු අගයකින් වර්ධනය විය. මෙම කාලපරිච්ඡේදය සඳහා රබර් නිෂ්පාදිත අපනයන සියයට 37.3 කින් වර්ධනය විය. 2011 සැප්තැම්බර් මාසයේ දී ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන සියයට 48 කින් වර්ධනය වූ අතර, ඇසුරුම් කළ සහ බෝතල් කරන ලද පළතුරු, සත්ත්ව ආහාර සහ පළතුරු හා එළවළු යුෂ මේ සඳහා සැලකිය යුතු අයුරින් දායක විය. සියළුම ප්‍රධාන උප කාණ්ඩයන්ගේ වර්ධනයන් වාර්තා කරමින් කෘෂිකාර්මික අපනයන ආදායම ඉහළ ගිය අතර මේ සඳහා මූලික වශයෙන් හේතු වූයේ මිල ඉහළ යාමයි. 2010 වසරේ අනුරූප මාසය සමග සසඳන විට 2011 සැප්තැම්බර් මාසයේ දී තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල එ.ජ.ඩොලර් 4.57 ක් දක්වා සියයට 3.9 කින් වර්ධනය වූ අතර, රබර් කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල එ.ජ.ඩොලර් 4.96 ක් දක්වා සියයට 40.3 කින් වර්ධනය විය. 2010 අනුරූප මාසයට සාපේක්ෂව 2011 සැප්තැම්බර් මාසයේ දී පොල් අපනයන සියයට 75.6 ක ශීඝ්‍ර වර්ධනයක් පෙන්වූ අතර, දිසිදි පොල්, කොප්පරා සහ පොල් තෙල්වල අපනයන පරිමාව සහ මිල යන අංශ දෙකෙහිම සිදුවූ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2011 සැප්තැම්බර් මාසයේ දී සුළු කෘෂිකාර්මික බෝග අපනයන ආදායම ද සියයට 12 කින් වර්ධනය විය.

ආනයන වර්ධනය සඳහා මූලික වශයෙන්ම හේතු වූයේ අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩයන්හි සිදුවූ වර්ධනයයි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට, 2011 සැප්තැම්බර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන සියයට 55.5 කින් වර්ධනය වූ අතර, ඛනිජ තෙල් ආනයන මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2010 සැප්තැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් 75.54 ක් වූ බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල සමග සසඳන විට 2011 අනුරූප කාලපරිච්ඡේදයේ දී බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල එ.ජ.ඩොලර් 108.43 ක් දක්වා ඉහළ යාම, ඛනිජ තෙල් ආනයන වියදම ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2011 සැප්තැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සියයට 94.3 කින් වර්ධනය වූ අතර, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළයාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ආයෝජන භාණ්ඩ ආනයන වියදම වර්ධනය වීම සඳහා රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා වන ආයෝජන භාණ්ඩ ගෙන්වීම ද දායක විය. 2011 සැප්තැම්බර් මාසය සඳහා පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 44.8 කින් වර්ධනය විය. ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළයාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ඉන් ආසන්න වශයෙන් සියයට 48.8 ක් පමණ මෝටර් රථවලින් සමන්විත වේ.


2011 පළමු මාස නවය තුළ දී අපනයන ආදායම හා ආනයන වියදම පිළිවෙලින් එ.ජ.ඩොලර් මිලියන 7,820 ක් දක්වා සියයට 27.7 කින් ද, එ.ජ.ඩොලර් මිලියන 14,685 ක් දක්වා සියයට 51.8


කින් ද වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 6,865 ක් දක්වා පුළුල් විය. මෙම වෙළෙඳ හිඟය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම රජය විසින් ලබාගන්නා ලද විදේශ ණය ආධාරයෙන් සිදුකරනු ලබන රජය සම්බන්ධ ව්‍යාපෘතීන් සඳහා කරන ලද ආනයනයන් ද ඇතුළත් විය. 2011 පළමු මාස නවය තුළ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව ඇතුළුව, රජයට වූ මුළු ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 3,430 ක් විය.

2010 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී 2011 වසරේ පළමු මාස නවය තුළ සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 580 ක් දක්වා සියයට 48 ක යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2010 වසරේ මෙම කාලපරිච්ඡේදය තුළ සංචාරකයෙකුගෙන් දිනකට ලද සාමාන්‍ය ආදායම එ.ජ.ඩොලර් 88 ක් වූ අතර, මෙම වසරේදී එය එ.ජ.ඩොලර් 97 ක් දක්වා වර්ධනය විය. 2010 වසරේ පළමු මාස නවය සමඟ සැසඳීමේ දී 2011 වසරේ පළමු මාස නවය තුළ දී සංචාරක පැමිණීම් 598,006 ක් දක්වා සියයට 34.3 කින් වර්ධනය විය. 2011 පළමු මාස නවය තුළ දී සංචාරක පැමිණීම්වලින් බහුතරයක් වූ 226,990 ක සංඛ්‍යාවක් බටහිර යුරෝපයෙන් පැමිණි අතර, මැද පෙරදිග, නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව සහ ඔස්ට්‍රලේශියා යන කලාපවලින් සංචාරකයින්ගේ පැමිණීම් ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. වසරේ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණෙන කාලය එළැඹීමට නියමිත වීම හේතුවෙන් 2011 වසර සඳහා සංචාරක පැමිණීම් සංඛ්‍යාව 850,000 පමණ වනු ඇතැයි අපේක්ෂා කරයි.

2011 වසරේ පළමු මාස නවය තුළ දී සමුච්චිත සේවා නියුක්ති ප්‍රේෂණ ගලා ඒම් එ.ජ.ඩොලර් මිලියන 3,782 ක් දක්වා සියයට 25.9 කින් වර්ධනය විය. වෙළෙඳ හිඟය මගින් ජංගම ගිණුම වෙත සිදුකරන ලද බලපෑම අවම කිරීම සඳහා සේවා අපනයනයේ පුළුල් වීම සහ සේවා නියුක්තික ප්‍රේෂණ ඉහළයාම උපකාරී විය. 2011 වසරේ පළමු මාස නවය සඳහා ජංගම ගිණුමේ හිඟය දළ වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 3,058 ක් විය.

2010 වසර අවසන් වන විට ආසියානු නිෂ්කාශණ සංගමයේ (ACU) ශේෂ රහිතව එ.ජ.ඩොලර් මිලියන 6,610 ක්ව පැවැති දළ නිල සංචිත ප්‍රමාණය, 2011 සැප්තැම්බර් මස අවසානයේ දී එ.ජ.ඩොලර් මිලියන 7,095 ක් දක්වා වර්ධනය විය. 2010 වසර අවසන් වන විට දළ නිල සංචිත සහ වාණිජ බැංකු සතු විදේශ වත්කම් ඇතුළුව මුළු විදේශ සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 8,035 ක්ව පැවැති අතර, එය



2011 සැප්තැම්බර් මස අවසන් වන විට එ.ජ.ඩොලර් මිලියන 8,584 ක් දක්වා වර්ධනය විය. ආනයනික මාස සැලකීමේ දී, 2011 සැප්තැම්බර් මස අවසන් වන විට දළ නිල සංචිත සහ මුළු විදේශීය සංචිත පිළිවෙළින් ආනයනික මාස 4.6 ක් සහ 5.6 කට සමාන වේ.

මෙම කාලපරිච්ඡේදය තුළදී විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.

## විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය

| | 2010 සැප්. (අ) එ.ජ.ඩො. මිලියන | 2011 සැප්. (ආ) එ.ජ.ඩො. මිලියන | සැප්. වර්ධනය (සියයට) | 2010 ජනː සිට සැප් (අ) එ.ජ.ඩො. මිලියන | 2011 ජනː සිට සැප්. (ආ) එ.ජ.ඩො. මිලියන | ජනː සිට සැප්. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **708.9** | **853.8** | **20.4** | **6,125.4** | **7,819.9** | **27.7** |
| කෘෂිකාර්මික | 173.8 | 196.1 | 12.9 | 1,547.6 | 1,760.6 | 13.8 |
| මෙයින්: තේ | 115.7 | 120.3 | 3.9 | 1,059.6 | 1,093.4 | 3.2 |
| කාර්මික | 527.2 | 646.5 | 22.6 | 4,506.9 | 5,959.3 | 32.2 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 293.5 | 333.8 | 13.7 | 2,476.0 | 3,113.2 | 25.7 |
| රබර් නිෂ්පාදිත | 51.7 | 71.0 | 37.3 | 391.6 | 645.7 | 64.9 |
| ආහාර පාන හා දුම්කොළ | 37.5 | 55.4 | 48.0 | 387.7 | 449.0 | 15.8 |
| ඛනිජ ද්‍රව්‍ය | 7.9 | 11.3 | 41.7 | 70.8 | 100.0 | 41.3 |
| **ආනයන** | **1,090.3** | **1,759.1** | **61.3** | **9,671.1** | **14,685.0** | **51.8** |
| පාරිභෝගික භාණ්ඩ | 232.8 | 337.2 | 44.8 | 2,064.8 | 3,096.1 | 50.0 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 117.0 | 154.3 | 32.0 | 1,261.2 | 1,594.4 | 26.4 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 115.9 | 182.8 | 57.8 | 803.6 | 1,501.7 | 86.9 |
| අන්තර් භාණ්ඩ | 607.6 | 944.9 | 55.5 | 5,391.5 | 8,193.4 | 52.0 |
| මෙයින්: ඛනිජ තෙල් | 258.5 | 327.4 | 26.7 | 2,238.6 | 3,308.3 | 47.8 |
| රෙදිපිළි හා ඇඟළුම් | 127.1 | 180.5 | 42.0 | 1,181.8 | 1,661.7 | 40.6 |
| ආයෝජන භාණ්ඩ | 241.7 | 469.6 | 94.3 | 2,058.8 | 3,303.6 | 60.5 |
| මෙයින්: යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 106.0 | 192.2 | 81.3 | 837.0 | 1,463.6 | 74.9 |
| ප්‍රවාහන උපකරණ | 40.0 | 112.1 | 180.1 | 406.4 | 684.2 | 68.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 68.8 | 121.1 | 75.9 | 595.5 | 815.4 | 36.9 |
| **වෙළෙඳ ශේෂය** | **-381.4** | **-905.2** | **137.4** | **-3,545.7** | **-6,865.1** | **93.6** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **345.7** | **401.6** | **16.2** | **3,004.4** | **3,782.1** | **25.9** |
| **විදේශ ඍජු ආයෝජන (FDI)** (ඇ) | **n.a.** | **n.a.** | **n.a.** | **208.0** | **413.0** | **98.6** |
| **සංචාරක ලැබීම්** | **41.7** | **58.4** | **40.2** | **391.8** | **580.1** | **48.1** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ)** | **215.2** | **253.8** | **17.9** | **2,044.4** | **3,429.7** | **67.8** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) විදේශ ඍජු ආයෝජන කාර්තුමය පදනම මත ඉදිරිපත් කර ඇත.
(ඈ) 2011 ජූලි මාසයේ රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවේ ලැබීම් ඇතුළත් වේ.

## 5. දේශීය සමාගම්වල සංස්ථාපිත ණයකරයන්හි කරනු ලබන විදේශීය ආයෝජනයන් සහ විදේශීය ණය ගැනීම් සම්බන්ධයෙන් වන රෙගුලාසි ලිහිල් කිරීම.

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි දේශීය සමාගම්වල සංස්ථාපිත ණයකරයන්හි කරනු ලබන විදේශීය ආයෝජන හා දේශීය ආයතන විසින් කරනු ලබන විදේශ ණය ලබාගැනීම සම්බන්ධයෙන් වන රෙගුලාසි පහත පරිදි ලිහිල් කර ඇත.*

i. දේශීය සමාගම් විසින් නිකුත් කරනු ලබන සංස්ථාපිත ණයකර සම්බන්ධ ලිහිල් කිරීම්

අ. ණයකරවල පොලී අනුපාතිකය මත පනවා තිබූ උපරිම සීමාව ඉවත් කර ඇත.

ආ. ණයකර නිකුත් කරන ආයතනය විසින් නිදන් අරමුදලක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ඉවත් කර ඇත.

ඇ. ණයකරවල අවම කල්පිරීමේ කාලය දැනට පවතින මට්ටම වන වර්ෂ 5 සිට වර්ෂ 2 දක්වා අඩු කර ඇත.

ii. විදේශයන්ගෙන් ණය ලබාගැනීම සම්බන්ධයෙන් වන ලිහිල් කිරීම්

අ. දේශීය ආයතනයකට අදාළව, ණයගැනීම් සඳහා වන දැනට පවතින සීමාව එ.ජ.ඩොලර් මිලියන 20 සිට එ.ජ.ඩොලර් මිලියන 50 දක්වා ඉහළ නංවා ඇත.

ආ. සංස්ථාපිත හෝ බැංකු ඇපකරවලට එරෙහිව විදේශ ණය ලබාගැනීම සඳහා දේශීය ආයතනයන්ට අවසර ප්‍රදානය කර ඇත.

කෙටිකාලීන ස්වභාවයේ අනෙකුත් ණය ගැනීම් හා අලුතින් සංස්ථාපනය කරන ලද ආයතන විසින් කරනු ලබන විදේශ ණය ගැනීම් හිදී අදාළ ඉල්ලීමෙහි යෝග්‍යාවය පදනම් කරගෙන මහ බැංකුවේ අනුමැතිය සඳහා සලකා බලනු ඇත.

මෙම නව ක්‍රියාපටිපාටීන් වර්තමානයේ වර්ධනය වෙමින් පවතින ආර්ථික ක්‍රියාකාරකම්වලට අවශ්‍ය වන තරගකාරී අඩු පිරිවැයකින් යුත් විකල්ප මූල්‍ය මූලාශ්‍රයක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි.

විදේශීය ණය ලබාගැනීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශයන් හා අදාළ අයදුම්පත්‍රය ශ්‍රී ලංකා මහ බැංකුවේ www.cbsl.gov.lk යන වෙබ් අඩවියෙන් ලබාගත හැක. දේශීය සමාගම්වල සංස්ථාපිත ණයකරයන්හි කරනු ලබන ආයෝජන සම්බන්ධයෙන් අදාළ ගැසට් නිවේදනය යථා කාලයේ දී නිකුත් කෙරෙනු ඇත.

## 6. කෘෂි බෝග හා දියර කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය ණය යෝජනා ක්‍රමය යටතේ සත්ව සංවර්ධන උපදේශකවරුන්ගේ සේවාව ඇගයීම - 2010

*කෘෂි බෝග හා දියර කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2008 වසරේ සිට දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණ වන්නේ රටෙහි කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම, නවීන විද්‍යාත්මක ගව පාලන ක්‍රම සඳහා කිරි ගොවීන් දිරිමත් කිරීම, කෘෂි බෝග ආශ්‍රිත සැකසුම් කර්මාන්ත සංවර්ධනය කිරීම සහ නව සේවා නියුක්ති අවස්ථා පුළුල් කිරීමයි.*

මේ සියලු කරුණු සඳහා පශු වෛද්‍ය නිලධාරීන්ගේ සහ සත්ව සංවර්ධන උපදේශකවරුන්ගේ සහයෝගය සහ දැනුම අවශ්‍ය වන අතර එම සේවා ලබා ගැනීම මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සිදු කෙරේ. එබැවින් පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පශු සම්පත් ක්ෂේත්‍රයේ නිලධාරීන් වෙත දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දී ඇත.

ඒ අනුව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ නවීන ආකාරයට ගව ගාල් ඉදි කිරීම, සතුන්ගේ මනා පෝෂණය සඳහා අවශ්‍ය ආහාර හා ජලය සම්පාදනය, සතුන්ට වැළඳෙන රෝග හඳුනාගැනීම, පාලනය සහ අදාළ ප්‍රතිකර්ම, කෘත්‍රිම සිංචනය, සතුන් ක්‍රමවත්ව රැකබලා ගැනීම, ජීව වායු ඒකක ඉදිකිරීම හා සත්ව ගොවිපළ කළමනාකරණය යන ප්‍රධාන අංශ කිහිපයක් යටතේ කිරි ගොවීන්ගේ දැනුම පුළුල් කිරීමේ වගකීම පශු වෛද්‍ය නිලධාරීන්හට පැවරේ.

මෙම ණය යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සත්ව සංවර්ධන උපදේශකවරුන්ට වාර්ෂිකව සම්පූර්ණ කළ යුතු ඉලක්ක අංශ 04 ක් යටතේ හඳුන්වා දී ඇත. ඒවා නම් ණය ලබා ගැනීම සඳහා සුදුසු කිරි ගොවීන් හඳුනා ගෙන ඔවුන් බැංකු වෙත යොමු කිරීම, කෘත්‍රිම සිංචනය, මගින් ගව අභිජනනය තෘණ වර්ග හා වෙනත් ගව ආහාර වගාව සහ ජීව වායු ඒකක ඉදි කිරීමයි. ඉහත එක් එක් අංශ යටතේ වාර්ෂික ඉලක්ක සම්පූර්ණ කරන ලද හෝ ඉක්මවන ලද නිලධාරීන් සඳහා වර්ෂාවසානයේ දී අදාළ දිරි දීමනාව ගෙවනු ලබයි.

2008 හා 2009 වර්ෂවල කාර්ය සාධනයන් මත සත්ව සංවර්ධන නිලධාරීන් පිළිවෙළින් 08 දෙනෙකු සහ 75 දෙනෙකු වෙත දිරි දීමනා හා සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී. 2008 සහ 2009 වර්ෂයන් හා සැසඳීමේ දී 2010 වර්ෂයේ මෙම දිරි දීමනා ලැබීමට සුදුසුකම් ලද ඉලක්ක සපුරා ඇති සත්ව සංවර්ධන උපදේශකවරුන් සංඛ්‍යාව 108 දක්වා ඉහළ ගොස් ඇත. ඒ අනුව 2010 වර්ෂයේ දී සුදුසුකම් ලත් නිලධාරීන් විසින් කෘත්‍රිම සිංචන මගින් සජීවී උපත් 19,109 ක් වාර්තා කර ඇති අතර ණය පහසුකම් අවශ්‍ය ගොවීන් හට ණය ලබා ගැනීම සඳහා ඔවුන් බැංකු වෙත යොමු කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමයෙහි සහභාගිත්ව මූල්‍ය ආයතන වන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශිය සංවර්ධන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව, යූනියන් බැංකුව, සණස සංවර්ධන බැංකුව, ඩී.එෆ්.සී.සී. බැංකුව හා ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවයි.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුළු පරිමාණයෙන් ගව පාලනයෙහි නිරත වන ගොවීන්ට ගව ගාල් තනා ගැනීම, ගව දෙනුන් මිලට ගැනීම, සතුන් සඳහා සාන්ද්‍ර ආහාර මිලට ගැනීම, ඖෂධ හා අදාළ වන වෙනත් පශු

වෛද්‍ය සේවා මිලට ගැනීම, ජීව වායු ඒකක ඉදි කර ගැනීම සහ පශු වෛද්‍ය නිලධාරීන් නිර්දේශ කරන වෙනත් අවශ්‍යතා සඳහා ඉහත සහභාගිත්ව මූල්‍ය ආයතන 10 මගින් 8% ක වාර්ෂික පොලී අනුපාතයකට රු.400,000 ක් දක්වා ණය මුදල් ලබා ගත හැක. මීට අමතරව 12% ක වාර්ෂික පොලියක් යටතේ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන්ට රුපියල් මිලියන 300 දක්වා ණය ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.

මෙම ණය යෝජනා ක්‍රමය ආරම්භයේ සිට 2011 වර්ෂයේ නොවැම්බර් 30 දක්වා අයදුම්කරුවන් 9,137 දෙනෙකුට රුපියල් දශ ලක්ෂ 1,470 ක ණය මුදල් ප්‍රමාණයක් මුදාහැර ඇත. ණය පහසුකම් ලබා ගැනීම සඳහා දිවයින පුරා පශු වෛද්‍ය නිලධාරීන්, සත්ව සංවර්ධන උපදේශකවරු, ණය දෙන බැංකු ශාඛා කාර්යාලවලින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය විස්තර ලබාගැනීමට පුළුවන.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 7. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 දෙසැම්බර්

*මේ වසරේ දෙවන භාගය පුරාම උද්ධමනය අඩුවෙමින් පැවතීම දක්නට ලැබුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (2006/07=100) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම අනුව මනින උද්ධමනය තවදුරටත් අඩුවෙමින් 2011 නොවැම්බර් වන විට සියයට 4.7 ක් ද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 6.9 ක් ද විය. මේ අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2011 නොවැම්බර් වන විට සියයට 4.9 ක් වූ අතර, වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය සියයට 7.2 ක් විය.*

විශේෂයෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදිත සම්බන්ධයෙන් සැපයුම් තත්ත්වයන් වැඩිදියුණුවීමත් සමග එය දේශීය මිල ගණන් පහළට ගෙනඒමට උපකාරී වූ අතර, ඉදිරි වසරවල දී දේශීය කෘෂිකාර්මික අංශයෙහි අපේක්ෂිත යහපත් ක්‍රියාකාරිත්වයත් සමගම ගමනාගමනය ඇතුළුව යටිතල පහසුකම්වල සිදුවන වැඩිදියුණුවීම්, ඉදිරි කාලයේ දී උද්ධමන පීඩන අඩුකිරීමට උපකාරී වනු ඇත.

ගෝලීය ආර්ථිකය තුළ, බොහෝ දියුණු ආර්ථිකවල ස්වෛරීත්ව ණය ආශ්‍රිත ගැටලු නිසා මූල්‍ය වෙළෙඳපොළ තුළ අවිනිශ්චිතතාවයක් මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල ගණන්හි විචලනයක් ද පවතී. මේ අතර, මෑතක දී භූ-දේශපාලනමය වශයෙන් ඇති වූ ගැටුම්කාරී තත්ත්වයන් මෙන්ම සැපයුම් සඳහා පවතින අවදානම වැනි සැපයුම් අංශයේ බාධාවන් හේතුකොට ගෙන ඉන්ධන මිල ගණන් අඛණ්ඩවම යම් විචලනයක් සහිතව ඉහළ අගයක පවතී. මෙම වර්ධනයන්ගේ බලපෑම පිළිබිඹු කරමින් මෙන්ම දේශීය ආර්ථික කටයුතු ශක්තිමත් ලෙස පුළුල් වීමත් සමගම ඇති වූ ආනයන ඉල්ලුම හේතුවෙන් 2011 වසර පුරාම ගෙවුම් ශේෂයෙහි වෙළෙඳ ගිණුමෙහි හිඟයක් දක්නට ලැබුණි. එසේ වුවද, පහත තත්ත්වයන් 2011 දී ගෙවුම් ශේෂය මත ඇතිවන පීඩනය සමනය කිරීමට උපකාරී වනු ඇත.

(අ) විශේෂයෙන්ම සංචාරක ඉපැයුම් වැඩිවීම නිසා සේවා ගිණුමට වූ ලැබීම් නොකඩවා ඉහළ යාම

(ආ) ඉහළ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

(ඇ) සංවර්ධන ව්‍යාපෘති සඳහා රජය විසින් ලබාගත් දිගුකාලීන ණය ඇතුළුව මූල්‍ය ගිණුමට වූ ලැබීම්

(ඈ) දැනට පවත්නා ඇස්තමේන්තු අනුව 2011 වසරේ දී ඉලක්කගත මට්ටම වූ එ.ජ.ඩොලර් බිලියනය ඉක්මවා ගොස් ඇති සෘජු විදේශ ආයෝජන

(ඉ) ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීමට වාණිජ බැංකු වෙත වූ ලැබීම්

(ඊ) වාණිජ බැංකු විසින් ලබාගත් කෙටිකාලීන මූල්‍ය ලැබීම්. බැංකුවල දෙවන පෙළ ප්‍රාග්ධනය එ.ජ.ඩොලර් බිලියනයක් දක්වා වැඩි විය හැකි බැවින් ඉදිරියේ දී බොහෝදුරට බැංකු විසින් තවත් අරමුදල් විදේශයන්ගෙන් ලබාගනු ඇත.

මුදල් අංශයෙහි වර්ධනයන් පිළිබඳව සලකා බැලීමේ දී, පෞද්ගලික අංශය විසින් ලබාගත් ණයෙහි වර්ධනය අඩුවීමත් සමග 2011 ඔක්තෝබර් වන විට පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය අඩුවීමක් පෙන්නුම් කරමින් එය සියයට 19.8 ක් බවට පත්විය. දේශීය වෙළෙඳපොළ පොලී අනුපාතිකවල මෑත සතිවල දී දක්නට ලැබුණු වැඩිවීම මෙන්ම පුළුල් වශයෙන් අපේක්ෂා කෙරෙන ගෝලීය ආර්ථිකයෙහි පසුබෑමත් සමග ණය වර්ධනයෙහි සහ ඒ අනුව මුදල් සැපයුමෙහි වර්ධනය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඒ අනුව මෙම ප්‍රවණතාව ඉදිරි මාසවල දී ද පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත සාකච්ඡා කරන ලද කරුණු ද ඇතුළත්ව, මෑතකාලයේ දී සිදු වූ සාර්ව ආර්ථික වර්ධනයන් සැලකිල්ලට ගෙන, අද දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී, මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. මේ අනුව, මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 7.00 ක් වනු ඇති අතර ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 8.50 ලෙස පවත්වා ගෙන යනු ඇත.


මීළඟ මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2012 ජනවාරි මස 13 වැනි දින නිකුත් කිරීමට නියමිතය.


# 8. 2011 ඔක්තෝබර් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය

*2011 ඔක්තෝබර් මාසයේ දී විදේශ වෙළෙඳාම තවදුරටත් පෙර පැවැති තත්ත්වයෙන්ම පැවැතිණි. 2010 ඔක්තෝබර් මාසයේ පැවැති ඉහළ අපනයන පදනම සහ තේ, රබර් සහ සුළු කෘෂිකාර්මික බෝග අපනයනයේ පැවැති පහත වැටීම පිළිබිඹු කරමින් 2011 ඔක්තෝබර් මාසයේ දී අපනයන එ.ජ.ඩොලර් මිලියන 882 දක්වා සියයට 4.9 කින් පහත වැටුණි.*

කෙසේවෙතත්, 2011 පළමු මාස දහය තුළ දී සමුච්චිත අපනයන ආදායම 2010 අනුරූප කාලය හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 8,702 ක් දක්වා සියයට 23.4 කින් වර්ධනය විය. ඒ සමගම 2010 ඔක්තෝබර් මාසය සමග සැසඳීමේ දී 2011 ඔක්තෝබර් මාසයේ ආනයන වියදම, ආයෝජන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයනයෙහි පැවැති වර්ධනය හේතුවෙන්, එ.ජ.ඩොලර් මිලියන 1,751 දක්වා සියයට 41.4 කින් වර්ධනය විය. 2011 පළමු මාස දහය තුළ සමුච්චිත ආනයන වියදම 2010 අනුරූප කාලය හා සැසඳීමේ දී, එ.ජ.ඩොලර් මිලියන 16,436 දක්වා සියයට 50.7 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2011 පළමු මාස දහය තුළ දී වෙළෙඳ හිගය එ.ජ.ඩොලර් මිලියන 7,734 දක්වා පුළුල් විය. මෙම වෙළෙඳ හිගයෙන් සැලකිය යුතු කොටසක් විදේශ ණය මගින් අරමුදල් සපයනු ලබන රජය විසින්, සිදුකරනු ලබන යටිතල පහසුකම් ව්‍යාපෘතීන්ට අදාල ආනයනයන්ගෙන් සමන්විත වේ. ඒ අනුව, 2011 පළමු මාස දහය තුළදී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව ද ඇතුළුව, රජයට වූ මුළු ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 3,507 ක් විය.

2010 වසරේ ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2011 ඔක්තෝබර් මාසයේ දී කාර්මික අපනයන සියයට 12.8 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මුළු අපනයනයන්ගෙන් සියයට 23 කට දායකත්වය ලබාදුන් කෘෂිකාර්මික අපනයන සියයට 10.3 කින් පහත වැටුණු අතර, 2011 ඔක්තෝබර් මාසයේ දී පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී තේ අපනයන ආදායම සියයට 12.1 කින් පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රබර් අපනයන මිල ඉහළ ගියද, අගය එකතු කළ අපනයන නිෂ්පාදන සඳහා දේශීය කර්මාන්තයන්ගෙන් රබර් සඳහා ඇති ඉහළ ඉල්ලුමෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2011 ඔක්තෝබර් මාසයේ දී රබර් අපනයන පරිමාව සියයට 40.8 කින් පහත වැටුණි. ගම්මිරිස්, කොකෝවා, පළතුරු සහ එළවළු අපනයන පහත වැටීම හේතුවෙන් සුළු කෘෂිකාර්මික බෝග අපනයන ආදායම ද පහත වැටුණි. කාර්මික



අපනයන වර්ධනය සඳහා රෙදිපිළි හා ඇඟළුම්, රබර් ආශ්‍රිත නිෂ්පාදිත, ඛනිජ තෙල් නිෂ්පාදිත, දියමන්ති හා ස්වර්ණාභරණ සහ ආහාර, පාන හා දුම්කොළ අපනයන ආදිය ප්‍රධාන වශයෙන් හේතු විය. 2011 ඔක්තෝබර් මාසයේ දී පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව රෙදිපිළි හා ඇඟළුම් අපනයන සියයට 12 කින් වර්ධනය විය. 2011 ඔක්තෝබර් මාසයේ රබර් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන 2010 වසරේ අනුරූප මාසය සමග සැසඳීමේ දී, සියයට 34.8 කින් වර්ධනය විය.

අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වර්ධනය වීම ආනයන වියදම වර්ධනය සඳහා මූලික වශයෙන් හේතු විය. පෙර වසරේ ඔක්තෝබර් මාසය සමග සැසඳීමේ දී අන්තර් භාණ්ඩ ආනයන සියයට 42.7 කින් වර්ධනය වූ අතර, ඛනිජතෙල් ආනයන වියදම ඉහළයාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. 2010 ඔක්තෝබර් මාසයේ දී එ.ජ.ඩොලර් 81 ක්ව පැවැති බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිලට සාපේක්ෂව 2011 ඔක්තෝබර් මාසයේ දී බොරතෙල් බැරලයක මිල එ.ජ.ඩොලර් 107.2 ක් වැනි ඉහළ මට්ටමක පැවැතීම ඛනිජ තෙල් ආනයන වියදම ඉහළයාමට හේතු විය. පොහොර ආනයන මිල මෙන්ම පරිමාව ද පිළිවෙළින් සියයට 28.9 කින් සහ සියයට 72.6 කින් වර්ධනය වූ අතර, ආනයන පරිමාවේ වූ සැලකිය යුතු වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ සියලුම බෝග ආවරණය වන අන්දමින් පොහොර සහනාධාරය පුළුල් කිරීමයි. 2011 ඔක්තෝබර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන සියයට 58.7 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2011 ඔක්තෝබර් මාසයේ දී පෙර වර්ෂයේ අනුරූප කාලයට සාපේක්ෂව පෞද්ගලික මෝටර් රථ ආනයනය සියයට 16.3 කින් පහත වැටුණ ද, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 12.7 කින් වර්ධනය විය.

2010 වසරේ අනුරූප කාලය සමග සැසඳීමේදී සංචාරක ඉපැයීම් 2011 වසරේ පළමු මාස එකොළහ තුළ එ.ජ.ඩොලර් මිලියන 736 දක්වා සියයට 46.7 ක යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2010 වසරේ මෙම කාලපරිච්ඡේදය තුළ සංචාරකයෙකුගේ දෛනික සාමාන්‍ය ආදායම එ.ජ.ඩොලර් 88 ක් වූ අතර, මෙම වසරේදී එය 97 දක්වා වර්ධනය විය. 2010 වසරේ මුල් මාස එකොළහ සමග සැසඳීමේදී මෙම වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ සංචාරක පැමිණීම් සංඛ්‍යාව 758,458 දක්වා සියයට 33.1 කින් වර්ධනය විය. සංචාරක පැමිණීම්වලින් බහුතරයක් වූ 281,484 ක පිරිසක් බටහිර යුරෝපයෙන් පැමිණි අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී මැද පෙරදිග, නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව සහ ඕස්ට්‍රලේශියා යන කලාපවලින් පැවැති සංචාරක පැමිණීම්ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

2011 වසරේ පළමු මාස දහය සඳහා සමුච්චිත සේවා නියුක්ති ප්‍රේෂණ ගලා ඒම් එ.ජ.ඩොලර් මිලියන 4,203 ක් දක්වා සියයට 24.3 කින් වර්ධනය විය. වෙළෙඳ හිඟය මගින් ජංගම ගිණුම වෙත සිදු කරනු ලබන බලපෑම අවම කිරීම සඳහා සේවා අපනයනයේ පුළුල්වීම සහ සේවා නියුක්ති ප්‍රේෂණ ඉහළ යාම උපකාරී විය. ඒ අනුව, 2011 වසරේ පළමු මාස දහය සඳහා ජංගම ගිණුමේ හිඟය දළ වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 3,253 ක් විය.

2010 වසර අවසානය වනවිට එ.ජ.ඩොලර් මිලියන 6,610 ක්ව පැවැති දළ නිල සංචිත ප්‍රමාණය (ආසියානු නිෂ්කාශන සංගමයේ ශේෂයන් රහිතව) 2011 ඔක්තෝබර් මස අවසානයේදී එ.ජ.ඩොලර් මිලියන 6,896 ක් දක්වා වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ උච්ඡාවචනයන් මඟහරවා ගනිමින්, කාලාන්තරයක් පුරා ඉහළ සංචිත ප්‍රමාණයක් එක්රැස් කරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, 2011 ජූලි මාසය අවසන් වනවිට දළ නිල සංචිත ප්‍රමාණය මෙතෙක් පැවැති ඉහළතම අගය වන එ.ජ.ඩොලර් මිලියන 8,099 ක් කරා ළඟා විය. ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් සහ ආයෝජන භාණ්ඩ සඳහා ආනයන ඉල්ලුම ඉහළයාම හේතු කොට ගෙන, විනිමය අනුපාතය මත ඇති විය හැකි පීඩනයන්ට මුහුණ දීම සඳහා මෙම සංචිතවලින් කොටසක් දැනටමත් ප්‍රයෝජනයට ගෙන ඇත. 2010 වසර අවසන් වනවිට දළ නිල සංචිත සහ වාණිජ බැංකු සතු විදේශ වත්කම් ඇතුළුව මුළු විදේශ සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර්

මිලියන 8,035 ක්ව පැවැති අතර, එය 2011 ඔක්තෝබර් මස අවසන් වනවිට එ.ජ.ඩොලර් මිලියන 8,136 ක් දක්වා වර්ධනය විය. ආනයනික මාස සැලකීමේ දී, 2011 ඔක්තෝබර් මස අවසන් වනවිට දළ නිල සංචිත සහ මුළු විදේශීය සංචිත පිළිවෙලින් ආනයනික මාස 4.4 ක් සහ 5.1 කට සමාන වේ.

මෙම කාලපරිච්ඡේදය තුළදී විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.

## විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය

| | 2010 ඔක්. (අ) එ.ජ.ඩො. මිලියන | 2011 ඔක්. (ආ) එ.ජ.ඩො. මිලියන | ඔක්. වර්ධනය (සියයට) | 2010 ජන: සිට ඔක්. (අ) එ.ජ.ඩො. මිලියන | 2011 ජන: සිට ඔක්. (ආ) එ.ජ.ඩො. මිලියන | ජන: සිට ඔක්. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **927.7** | **882.2** | **-4.9** | **7,053.1** | **8,702.1** | **23.4** |
| කෘෂිකාර්මික | 226.5 | 203.1 | -10.3 | 1,774.1 | 1,963.7 | 10.7 |
| මෙයින්: තේ | 145.0 | 127.4 | -12.1 | 1,204.6 | 1,220.9 | 1.4 |
| කාර්මික | 593.7 | 669.7 | 12.8 | 5,100.6 | 6,629.0 | 30.0 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 318.8 | 357.0 | 12.0 | 2,794.8 | 3,470.1 | 24.2 |
| රබර් නිෂ්පාදිත | 61.5 | 82.9 | 34.8 | 453.0 | 728.6 | 60.8 |
| ආහාර පාන හා දුම්කොළ | 40.5 | 52.0 | 28.4 | 428.2 | 501.1 | 17.0 |
| ඛනිජ ද්‍රව්‍ය | 8.0 | 9.3 | 15.5 | 78.8 | 109.3 | 38.7 |
| **ආනයන** | **1,238.2** | **1,751.0** | **41.4** | **10,909.2** | **16,436.0** | **50.7** |
| පාරිභෝගික භාණ්ඩ | 270.0 | 336.8 | 24.8 | 2,334.8 | 3,432.9 | 47.0 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 110.5 | 157.0 | 42.1 | 1,371.7 | 1,751.3 | 27.7 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 159.5 | 179.8 | 12.7 | 963.1 | 1,681.6 | 74.6 |
| අන්තර් භාණ්ඩ | 698.3 | 996.4 | 42.7 | 6,089.8 | 9,189.8 | 50.9 |
| මෙයින්: ඛනිජ තෙල් | 240.7 | 374.2 | 55.5 | 2,479.3 | 3,682.5 | 48.5 |
| රෙදිපිළි හා ඇඟළුම් | 194.4 | 190.8 | -1.8 | 1,376.2 | 1,852.5 | 34.6 |
| ආයෝජන භාණ්ඩ | 261.5 | 415.1 | 58.7 | 2,320.3 | 3,718.7 | 60.3 |
| මෙයින්: යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 102.0 | 161.6 | 58.4 | 939.0 | 1,625.3 | 73.1 |
| ප්‍රවාහන උපකරණ | 56.7 | 105.1 | 85.3 | 463.1 | 789.3 | 70.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 73.4 | 107.8 | 46.8 | 668.9 | 923.3 | 38.0 |
| **වෙළෙඳ ශේෂය** | **-310.4** | **-868.9** | **179.9** | **-3,856.1** | **-7,733.9** | **100.6** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **376.0** | **420.6** | **11.8** | **3,380.4** | **4,202.7** | **24.3** |
| **විදේශ සෘජු ආයෝජන (FDI) (ඇ)** | **n.a** | **n.a** | **n.a** | **309.7** | **679.3** | **119.3** |
| **සංචාරක ලැබීම්** | **63.6** | **88.2** | **38.7** | **501.5** | **735.7** | **46.7** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ)** | **1,218.5** | **121.5** | **-90.0** | **3,262.9** | **3,507.3** | **7.5** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) 2010 සහ 2011 පළමු මාස නවය සඳහා විදේශීය සෘජු ආයෝජන
(ඈ) 2010 සහ 2011 පළමු මාස එකොළහ සඳහා සංචාරක ඉපැයීම්
(ඉ) 2010 සහ 2011 රාජ්‍ය අංශයේ ලැබීම් තුළ පිළිවෙළින් 2010 ඔක්තෝබර් සහ 2011 ජූලි මාසයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවේ ලැබීම් ඇතුළත් වේ.

## 9. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2010 සහ 2011

(2006/07= 100)

| මාසය | දර්ශකය | | මාසික වෙනස්වීම % | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2010 | 2011 | 2010 | 2011 | 2010 | 2011 |
| ජනවාරි | 140.4 | 149.2 | 1.9 | 1.4 | 7.1 | 6.2 | 3.2 | 6.1 |
| පෙබරවාරි | 141.1 | 151.3 | 0.5 | 1.4 | 7.5 | 7.2 | 3.3 | 6.1 |
| මාර්තු | 139.8 | 150.6 | -0.9 | -0.5 | 7.2 | 7.7 | 3.4 | 6.2 |
| අප්‍රේල් | 138.4 | 150.6 | -1.0 | 0.1 | 6.8 | 8.9 | 3.8 | 6.4 |
| මැයි | 140.1 | 151.5 | 1.2 | 0.6 | 5.6 | 8.2 | 3.9 | 6.6 |
| ජුනි | 141.2 | 151.2 | 0.8 | -0.2 | 5.1 | 7.1 | 4.3 | 6.7 |
| ජූලි | 141.2 | 151.7 | 0.0 | 04 | 4.4 | 7.5 | 4.6 | 7.0 |
| අගෝස්තු | 141.4 | 151.3 | 0.2 | -0.3 | 5.0 | 7.0 | 4.9 | 7.1 |
| සැප්තැම්බර් | 142.6 | 151.7 | 0.8 | 0.3 | 5.7 | 6.4 | 5.3 | 7.2 |
| ඔක්තෝබර් | 144.1 | 151.5 | 1.1 | -0.1 | 6.5 | 5.1 | 5.7 | 7.1 |
| නොවැම්බර් | 145.7 | 152.6 | 1.1 | 0.7 | 6.9 | 4.7 | 6.1 | 6.9 |
| දෙසැම්බර් | 147.2 | 154.4 | 1.1 | 1.2 | 6.8 | 4.9 | 6.2 | 6.7 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව